හබරාදුව ප්‍රාදේශීය සභාව
සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2027

2027 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම වෙනුවෙන් හබරාදුව ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වීමට අපේක්ෂා කරනු ලබන නිෂ්පාදකයන්ගෙන්, සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2026.10.28 දින සිට 2026.12.14 දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ.

01. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2027 යනුවෙන් සඳහන් කළ යුතුය. ලියාපදිංචි වීමේ ගාස්තුව ලෙස ඒ ඒ සැපයුම් හා සේවාවන් ඉදිරියෙන් දක්වා ඇති මුදල, මුදලින් හෝ චෙක්පත මගින් ගෙවිය හැකි අතර, අදාළ චෙක්පත සභාපති, හබරාදුව ප්‍රාදේශීය සභාව යනුවෙන් ලියා එවිය යුතුය.

02. **එක් ව්‍යාපාරයක්/ආයතනයක් විසින් එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතු අතර එක් අයදුම්පතක් මගින් අයිතම එකක් හෝ ඊට වඩා වැඩි ඕනෑම ප්‍රමාණයක් සඳහා ලියාපදිංචි වීම සිදුකළ හැකි ය. අයදුම්පතක් මඟින් ඉල්ලුම්කරන අයිතම ප්‍රමාණය අනුව ලියාපදිංචි ගාස්තු ගෙවිය යුතු ය.**

03. අදාළ අයදුම්පත් පැමිණ ලබා ගැනීමට හෝ නැතහොත් පහත දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව තමන් විසින් පිළියෙල කරගෙන අවශ්‍ය සහතික පත්වල පිටපත් ද සහිතව **ලේකම්, හබරාදුව ප්‍රාදේශීය සභාව** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සැපයුම්

අයිතම අංකය	සැපයුම්/සේවා	ලියාපදිංචි ගාස්තුව
01	කාර්යාලීය ලිපිද්‍රව්‍ය සහ උපකරණ	1000
02	කාර්යාලීය යන්ත්‍ර සූත්‍ර උපකරණ (පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ඩුප්ලෝ යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, යතුරු ලියන, වායු සමීකරණ යන්ත්‍ර)	1000
03	කාර්යාලීය භාණ්ඩ - මේස, පුටු, අල්මාරි ගොනු කැබිනට් (දැව, වානේ, ප්ලාස්ටික්)	1000
04	තීන්ත හා ටෝනර් සැපයීම - (පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ඩුප්ලෝ යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර සඳහා)	1000
05	සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ (අත් ආවරණ, ගම්බූට්ස්, පවිත්‍ර කාරක, විෂ බීජ නාශක, මැසි නාශක, මදුරු නාශක, උදලු, කැති, පිහි, රේක්ක, විල්බැරෝ, ඉදල්, කොසු, කූඩා, තණකොළ කපන යන්ත්‍ර සහ අමතර කොටස්)	1000
06	විදුලි උපකරණ, වීථි පහන් සඳහා අවශ්‍ය උපාංග සහ විදුලි සේවක ආරක්ෂිතඋපකරණ කට්ටල - විදුලි සේවක ආරක්ෂිත හිස් වැසුම්, අත් ආවරණ, බඳපටි, සපත්තු සහ ඕවරෝල් කිට් සැපයීම සඳහා	1000
07	ජල නළ උපාංග - පිවිසි බට, චතුර ටැංකි	1000
08	භියුම් පයිප්ප සහ කොන්ක්‍රීට් නිෂ්පාදන	1000
09	ටයර්, ටියුබ්, බැටරි, (කැබ් රථ, ට්‍රක්රථ, ජේසීබී, ට්‍රැක්ටර්, කම්පැක්ටර් හා ත්‍රී රෝද රථ)	1000

10	වාහන අමතර කොටස් සැපයීම (කැබ්රථ, ට්‍රක් රථ, ජේසීබී, ට්‍රැක්ටර්, කම්පැක්ටර් රථ හා ත්‍රී රෝද රථ)	1000
11	CCTV කැමරා උපාංග සවි කිරීම, නඩත්තුව හා සේවා සැපයීම	1000
12	ළමා උද්‍යාන ක්‍රීඩා භාණ්ඩ සහ ක්‍රීඩා උපකරණ සැපයීම	1000
13	නිල ඇඳුම් සඳහා රෙදි සැපයීම සහ නිමි ඇඳුම් සැපයීම (කාකි, කපු රෙදි, කෘත්‍රිම රෙදි, සුදු කෘතිම රෙදි සහ හයිසොෆි වර්ගයේ)	1000
14	සපත්තු, හිස් වැසුම් සහ වැහි කබා	1000
15	ප්‍රිමික්ස්, දියර තාර, ඒබීසී, කොරිපස් සැපයීම	1000
16	ගොඩනැගිලි ද්‍රව්‍ය (ගල්, වැලි, සිමෙන්ති, කම්බි, ටයිල් වැසිකිළි හා නාන කාමර උපාංග, දැල්, තීන්ත යනාදිය හා හාඩ්වෙයාර් බඩු)	1000
17	ත්‍යාග භාණ්ඩ (පාසල් උපකරණ, පෙර පාසල් පොත් බෑග්, කුඩ, සෙල්ලම් බඩු)	1000

සේවා සැපයීම්

අයිතම අංකය	සැපයුම්/සේවා	ලියාපදිංචි ගාස්තුව
18	මුද්‍රණ සේවා - ලිපිලේඛන, ලිපිගොනු, ආකෘති පත්‍ර මුද්‍රණය සහ රබර් මුද්‍රා, දින මුද්‍රා, ඇතුළු මුද්‍රා සකස් කිරීම.	1000
19	කාර්යාලීය හැදුනුම්පත් සකස් කිරීම.	1000
20	කාර්යාලීය යන්ත්‍ර සූත්‍ර උපකරණ අලුත්වැඩියාව (පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර,)	1000
21	නාම පුවරු, දැන්වීම්, බැනර් සකස් කිරීම	1000
22	ගොඩනැගිලි මාර්ග ඉදිකිරීමේ සහ නඩත්තු සේවා කොන්ත්‍රාත් රුපියල් ලක්ෂ 05 ට අඩු	1000
23	වඩු වැඩ, ඇලුමිනියම් කාර්මික, පෙදරේරු වැඩ, වෙල්ඩින් වැඩ, ජලනල කාර්මික වැඩ	1000
24	මාර්ග තලන, ඩෝසර්, බැකෝ, එක්ස්කැවේටර්, කියුබ් 01 ලොරි රථ කුලියට සැපයීම් සහ ප්‍රවාහන සේවා සැපයීම (කැබ්,වෑන්, ත්‍රීරෝද රථ, මෝටර් කාර්,)	1000
25	කැබ් රථ, ලොරි රථ, ට්‍රැක්ටර්, ත්‍රී රෝද රථ, කම්පැක්ටර් රථ අලුත්වැඩියා සහ සේවා කටයුතු කිරීම (බල ප්‍රදේශය තුළ හෝ ඊට යාබද පිහිටා තිබිය යුතුය)	1000
26	ශබ්ද විකාශන යන්ත්‍ර, උත්සව භාණ්ඩ, විදුලි ජනක යන්ත්‍ර, කුලියට සැපයීම	1000
27	නීතීඥ සේවා සහ මිනින්දෝරු සේවා සැපයීම	1000
28	ජල මෝටර් අලුත්වැඩියාව	1000

29	කාර්යාලීය මේස, පුටු, දොර, ජනෙල් අලුත්වැඩියාව	1000
30	අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම	1000
31	කොන්ත්‍රාත්කරුවන් (ඉදිකිරීම් ඇතුලු සියලු කටයුතු සඳහා)	1000
32	පවිත්‍රතා සේවා සහ සනීපාරක්ෂක සේවා සැපයීම	1000
33	ගලි බවුසර් සේවා සැපයීම	1000
34	අභ්‍යන්තර දුරකථන සේවා සැපයීම	1000

04. සැපයුම් සඳහා සෑම විටම ලියාපදිංචි සැපයුම් කරුවන් අතරින් මිල ගණන් කැඳවන ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී බාහිර සැපයුම්කරුවන්ගෙන් ද මිල ගණන් කැඳවීමේ අයිතිය සභාව සතුය.

05. මිල ගණන් අවම වශයෙන් මාස හයක (06) කාලයක් සඳහාවත් නොවෙනස්ව ස්ථාවරව තැබිය යුතුය.

06.භාණ්ඩ සහ සේවා සැපයීම සඳහා වන පළපුරුද්ද තහවුරුකිරීම සඳහා ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

07. නිසි පරිදි මිල ගණන් ඉදිරිපත් කිරීමට සහ කලට වේලාවට භාණ්ඩ සැපයීමට අපොහොසත් වන හා ඇණවුමේ සඳහන් විස්තරයට හා ආදර්ශයන්ට අනුකූලව, මනා තත්වයෙන් යුතු භාණ්ඩ සැපයීම පැහැර හරින සැපයුම්කරුගේ ලියාපදිංචිය අවලංගු කොට අසාධුගත ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

08. භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් සැපයීමේදී රජයේ අනුමත බදු වර්ගය / කොන්දේසි වලට සභාවේ නීති වලට යටත් විය යුතුය.

09. ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් බාහිරව කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ අයිතිය සභාව සතුය.

10. ලියාපදිංදිංචි වීම සඳහා අයදුම්කරනු ලබන සෑම සැපයුම්කරුවෙකුම ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටපතක් අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

11. වැට් බදු සඳහා ලියාපදිංචි සැපයුම්කරුවෙකු වන්නේ නම් ලියාපදිංචි වැට් බදු කාලය ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන්නේ නම් බිල්පත් සඳහා වැට් අගය නොගෙවනු ලැබේ.

12. කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වීමේදී පළාත් සභාවේ හෝ වෙනත් පළාත් පාලන ආයතනයක හෝ ඉදි කිරීම් කර්මාන්ත සංවර්ධනය අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී ඇති බවට අදාළ සහතිකය ඉදිරිපත් කළ යුතුය.

තක්ෂිණ රවිශාන් ගමගේ
සභාපති,
හබරාදුව ප්‍රාදේශීය සභාව

ආදර්ශ අයදුම්පත්‍රය

2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - හබරාදුව ප්‍රාදේශීය සභාව

01. සැපයුම්කරුගේ/ව්‍යාපාරයේ නම : .....

02. සැපයුම්කරුගේ/ව්‍යාපාරයේ ලිපිනය : .....

.....

03. දුරකථන අංකය : .....

04. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය: .....

05. සපයනු ලබන සේවාව/භාණ්ඩ: .....

06. VAT ලියාපදිංචි අංකය: .....

07. CIDA ලියාපදිංචි අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය: .....

08. පිරිනැමිය හැකි ණය කාල සීමාව: .....

09. චෙක්පත් අංකය/මුදල් ඇණවුම් අංකය: .....

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, අදාළ ලියාපදිංචි සහතිකය මෙයට අමුණා ඇති බවත් මෙයින් සහතික කරමි.

....

දිනය සැපයුම්කරුගේ අත්සන සහ නිල මුද්‍රාව

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ලදුපත් අංකය ..... දිනය .....

ලියාපදිංචි කිරීමේ ලේඛනයේ පිටු අංකය .....

....

විෂය නිලධාරී ලේකම්
හබරාදුව ප්‍රාදේශීය සභාව